# පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

**වායු සම්පත් කළමනාකරණ සහ ජාතික ඕසෝන් ඒකකය**

# දැන්වීමයි

## 2020 වසර සඳහා හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් (HCFC) ආනයනික කෝටා ලබා ගැනීමට ලියාපදිංචි වීම

ශ්‍රී ලංකාව 1989 වසරේ සිට ඕසෝන් ප්‍රහීනකාරක ද්‍රව්‍යයන් භාවිතයෙන් ඉවත් කිරීම පිලිබඳ මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශවකරුවෙකු ලෙස කටයුතු කරයි. පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයේ වායු සම්පත් **කළමනාකරණ** හා ජාතික ඕසෝන් ඒකකය මොන්ට්‍රියල් සන්ධානයේ ප්‍රතිපත්තිමය තීරණ ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කරන ජාතික කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කරයි.

මොන්ට්‍රියල් සන්ධානයේ 19 වන පාර්ශවකරුවන්ගේ රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක XIX/6 ට අනුකූලව එම සන්ධානයේ සෑම පාර්ශවකාර රාජ්‍යයක්ම නිෂ්පාදනය කරනු ලබන සහ භාවිත කරනු ලබන හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් (HCFC) ප්‍රමාණය අදියරගතව, ක්‍රමානුකූලව සහ සැලසුම් සහගතව අඩු කිරීමට එකඟතවය පල කර ඇත. ඒ අනුව, එක් එක් පාර්ශවකාර රාජ්‍යයන් විසින් එක් වසරක් තුල උපරිම වශයෙන් භාවිතා කළ හැකි HCFC ප්‍රමාණය සඳහා සීමාවන් පනවා ඇත. තවද **2020 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා පාදක මට්ටමින් 35% ක ප්‍රමාණයක් අඩුකිරීමක් සිදුකරන අතර මෙම කාලය තුල ආනයන කෝටා ප්‍රමාණය එම පදනම මත තීරණය වේ.** ශ්‍රී ලංකාව එසේ හිමිකම් ලබන HCFC ප්‍රමාණය එනම් කෝටාව සෑම වර්ෂයක් ආරම්භයේදීම සුදුසුකම් ලබන වෙළඳ ආයතන වෙත නිසි ක්‍රමවේදයකට අනුකූලව බෙදා දෙනු ලබයි .

ඒ අනුව පසුගිය වසර 5 ක හෝ ඊට වැඩි කාලයක් තුල ශීතකාරක ආනයනය කරන ලද වෙළඳ ආයතන මෙන්ම ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ අනෙකුත් කාර්යයන්හි නියැලී ඇති බවට සහතික කල හැකි ආයතන එනම් උපකරණ සවි කරන හෝ සේවා කටයුතු සිදු කරනු ලබන ආයතන 2020 වසර සඳහාද කෝටා ලබා ගැනීමට සුදුසුකම් ලබනු ඇත. 2020 වසර සඳහා HCFC ආනයනික කෝටා ලබා ගැනීමට උනන්දුවක් දක්වන වෙළඳ ආයතන විසින් පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කල යුතු අතර පහත සඳහන් කාණ්ඩ දෙක යටතේ එම අයදුම්පත්‍ර සලකා බැලීමට නියමිත වේ.

1. ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ සේවා සපයනු ලබන ආයතන
2. ශීතකාරක ආනයනයේ පමණක් නියැලී සිටින ආයතන

**<u>ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පහත තොරතුරු ලබාදීම අනිවාර්ය බව කාරුණිකව සලකනු මැනවි.</u>**

1. ආයතනයේ/ හිමිකරුගේ නම :
2. ලිපිනය :
3. දුරකථන අංකය :
4. ව්‍යාපාර ලියාපදිංචි අංකය හා දිනය :
5. ව්‍යාපාරයේ ස්වභාවය :
6. ආදායම් බදු අංකය (අදාල වේ නම්) :
7. TIN අංකය (අදාල වේ නම්) :
8. HCFC ශීතකාරක ආනයනය හෝ සේවා සැපයීම පිළිබඳ පලපුරුද්ද :
   (ශීතකාරක වර්ගය, ප්‍රමාණය හා 2019 ඇතුලුව පසුගිය වසර 5 ක් තුල එක් එක් වසර වලදී සිදු කල ආනයනයන්/ සේවා සැපයීම්)
9. 2020 වසර සඳහා ආනයනය කිරීමට අයදුම් කරන HCFC වර්ගය හා ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) :

ඉහත තොරතුරු සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කල යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර ලබා දෙන කෝටා ප්‍රමාණය තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් නිර්දේශ කෙරෙනු ඇත. මේ පිළිබඳව පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත් අවශ්‍ය ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත්ද සමග 2020 ජනවාරි මස 28 දින හෝ ඊට පෙර **අධ්‍යක්ෂ, වායු සම්පත් කළමනාකරණ සහ ජාතික ඕසෝන් ඒකකය, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය, 'සොබාදම් පියස' , 416/C/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල** යන ලිපිනයට ලැබෙන ලෙස <u>ලියාපදිංචි තැපැලෙන් පමණක්</u> යොමු කල යුතුය. මේ සම්බන්ධ වැඩි විස්තර 011 203 4221 හෝ 0112034218 යන දුරකතන අංක ඔස්සේ ලබාගත හැකි බවද සලකන්න.

**ලේකම්**
පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය
**බත්තරමුල්ල**